# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1368 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 23/08/2024<br>පැය 1440 |

## මාධ්‍ය නිවේදනය

### 01. මාරක රිය අනතුරක් - යක්කල පොලිස් වසම.

2024.08.22 වන දින අළුයම් කාලයේ යක්කල පොලිස් වසමේ කොළඹ නුවර මාර්ගයේ වැරැල්ලවත්ත ප්‍රදේශයේදී නුවර දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ කාර් රථයක් රියදුරුගේ පාලනයෙන් මිදී මාර්ගයේ මැද දූපතේ පිහිටි විදුලි කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කාර් රථයේ ගමන් කළ කාන්තාවන් තිදෙනෙකු, රියදුරු ඇතුළු පිරිමි පුද්ගලයෙකු හා කුඩා පිරිමි දරුවන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා ගම්පහ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී කාන්තාවක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 72 ක් වූ දර්ගා නගර්, අලුත්ගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණ සිදුකර ඥාතීන්ට භාර දී ඇත. යක්කල පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - හබරාදූව පොලිස් වසම.

2024.08.22 වන දින උදෑසන කාලයේ හබරාදූව පොලිස් වසමේ බොනවිස්ටාව හන්දිය අසල ඇළෙහි පුද්ගල මළ සිරුරක් ඇති බවට හබරාදූව පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරදු 30 ක් වන නාකියාදෙනිය, ගාල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාර දී ඇත. හබරාදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**